# තොරතුරු ගවේෂණය සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල තුළ භාවිත කරනු ලබන තොරතුරු ගවේෂණ උපක්‍රම පිළිබඳ විද්‍යාර්ථීන්ගේ දැනුවත්භාවය පිළිබඳ අධ්‍යනයක් (කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලය ඇසුරින්)

*ඩබ්ලිව්. ආර්. එන්. ඉන්ද්‍රචාපා [1]*

**සංක්ෂේපය**

තාක්ෂණයේ දියුණුවත් සමග වර්තමානය වනවිට තොරතුරු බිහිවීමේ සීඝ්‍රතාවය වර්ධනය වී ඇත . මේ හේතුවෙන් විවිධ විෂය ක්ෂේත්‍රයකට අදාළව විවිධාකාර තොරතුරු බිහිවන අතර තොරතුරු බහුලතායක් ඇති වී තොරතුරු පුපුරායාමකට ලක් වේ . මෙලෙස තොරතුරු බහුලතාවය නිසාවෙන් තමාට අවශ්‍ය නිවැරදි තොරතුරු නිවැරදි ආකාරයෙන් ලබා ගැනීමට බොහෝ දෙනා උත්සහ කරනු ලබයි. . ඒ අතරින් විශේෂිත කණ්ඩායමක් ලෙස විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දැක්විය හැකිය . එම නිසා වර්තමානයේ විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ විද්‍යාර්ථීන්ට නිවැරදි තොරතුරු ගවේෂණය සඳහා විවිධ ගවේෂණ උපක්‍රම හඳුන්වා දී ඇත . මෙම තොරතුරු ගවේෂණ උපක්‍රම හරහා තොරතුරු අවශ්‍ය වේලාවට , නිවැරදි ආකාරයෙන් ලබා ගැනීමට හැකියාව ලැබේ . මෙලෙස විවිධාකාර වූ ගවේෂණ ක්‍රමවේදයන් විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ පැවතියද ඒ පිළිබද විද්‍යාර්ථීන් තුළ පවතින දැනුවත්භාවය මදගතියක් පැවතීම මෙම පර්යේෂණයට පාදක වූ ගැටලුවයි . මෙම අධ්‍යනයේ මූලික අරමුණු වන්නේ , විශ්වවිද්‍යාල පුස්තකාලයන් තුළ තොරතුරු ගවේෂණයට භාවිතා කරනු ලබන ගවේෂණ උපක්‍රම හදුනාගැනීම , ගවේෂණ ක්‍රම භාවිතයෙන් විද්‍යාර්ථීන්ට තොරතුරු දැනගැනීමට ඇති හැකියාව අධ්‍යනය කිරීම හා ගවේෂණ ක්‍රමවේදයන් පිළිබඳ ඔවුන්ගේ පවතින දැනුවත්භාවය හදුනා ගැනීමයි . මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ප්‍රථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිතා කළ අතර ප්‍රථමික මූලාශ්‍රයන් ලෙස නිරීක්ෂණය හා ප්‍රශ්නාවලීන් ද ද්විතීයික මූලාශ්‍රයන් ලෙස පොත්පත් හා වාරසඟරාද භාවිතා කරන්නට විය . මෙම අධ්‍යනය සිදුකරනු ලැබූයේ සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක පරේය්ෂණ ක්‍රමවේදය මිශ්‍රිතව භාවිතා කර ගනිමිනි. එමෙන්ම සංගහණය වශයෙන් කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලය භාවිතා කරනු ලබන සියලුම විද්‍යාර්ථීන් තෝරාගනු ලැබූ අතර නියැදිය තේරීමේදී අහඹු නියැදීමේ ක්‍රමට යටතේ විද්‍යාර්ථීයින් 200 දෙනෙකු තෝරාගනු ලැබීය . මෙහිදී දත්ත විශ්ලේෂණය සඳහා EXCEL මෘදුකාංගය භාවිතා කරනු ලැබීය . මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් පුස්තකාලයන් තුළ විවිධාකාර තොරතුරු ගවේෂණ උපක්‍රම භාවිතා කළද එකිනෙක විද්‍යාර්ථීන් තුළ ඒ පිළිබද පවතින දැනුවත්භාවය දුර්වල මට්ටමක පවතින බව හා පුස්තකාලය තුළ භාවිත කරනු ලබන ගවේෂණ ක්‍රමවේදයන් ප්‍රමාණවත් නොවන බව අනාවරණ කරගත හැකි විය.

**මුඛ්‍ය පදඃ** *තොරතුරු තාක්ෂණය , තොරතුරු ගවේෂණය , ගවේෂණ ශිල්ප ක්‍රම , සෙවුම් වර්ග , විශ්වවිද්‍යාලය*

[1] nayanachapa15@gmail.com, නාවික හා ඉංජිනේරු විශ්වවිද්‍යාලය